67433

© හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department

**30 S II**

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2003 අප්‍රේල්
# கல்விப் பொதுத் தராதரப்பத்திர(உயர் தர)ப் பரீட்சை, 2003 ஏப்பிரல்
# General Certificate of Education (Adv. Level) Examination, April 2003

## ගිණුම්කරණය II / கணக்கீடு II / Accounting II

පැය තුනයි / மூன்று மணித்தியாலம் / Three hours

මෙම ප්‍රශ්න පත්‍රය පිටු 8 කින් සමන්විත ය.

උපදෙස් :
* පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
* එක් එක් ප්‍රශ්නයට අදාළ පෙරවැඩ ඒ ඒ ප්‍රශ්නය සමග අමුණන්න.

1. (අ) (i) සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් තුළ අන්තර්ගත වාර්තාවන් සඳහන් කරන්න.
(ii) මූල්‍ය ප්‍රකාශන භාවිත කරන පාර්ශ්වයන් හතරක් සඳහන් කරන්න.
(iii) මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන අරමුණ සඳහන් කරන්න.
(iv) 'කොටස්' සහ 'ණයකර' අතර ඇති ප්‍රධාන වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.
(v) 'සාමාන්‍ය කොටස්' සහ 'වරණීය කොටස්' අතර ඇති ප්‍රධාන වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.
(vi) සාමාන්‍ය කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් දෙකක් සඳහන් කරන්න.
(vii) 'සංචිත' සහ 'වෙන්කිරීම්' අතර ඇති ප්‍රධාන වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.
(viii) 'ප්‍රාග්ධන සංචිත' සහ 'අයභාර සංචිත' අතර ඇති ප්‍රධාන වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.
(ix) කොටස් අධිමිල ගිණුමේ ශේෂය යොදාගත හැකි අවස්ථා දෙකක් සඳහන් කරන්න.
(x) 'ප්‍රසාද නිකුතුව' සහ 'අයිතිවාසිකම් නිකුතුව' අතර ඇති ප්‍රධාන වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.
(ලකුණු 10 යි.)

(ආ) 2003 මාර්තු 31 දිනට සීමිත මානෙල් සමාගමේ පොත්වලින් උපුටාගත් ශේෂ පිරික්සුම මෙසේ ය.

| | හර<br>රු. '000 | බැර<br>රු. '000 |
|---|---|---|
| එකක් රු. 10 වූ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 2 700 |
| එකක් රු. 10 වූ 18 % සිදහස් කළ හැකි වරණීය කොටස් ප්‍රාග්ධනය | | 1 500 |
| කොටස් අධිමිල | | 450 |
| ලාභ/ලාභ ගිණුමේ ශේෂය 2002.04.01 දිනට | | 250 |
| ඉඩම් - පිරිවැයට | 4 400 | |
| බෙදහැරීමේ රථ - පිරිවැයට | 2 400 | |
| කාර්යාල උපකරණ - පිරිවැයට | 1 000 | |
| ක්ෂය වෙන්කිරීම් 2002.04.01 දිනට | | |
| - බෙදහැරීමේ රථ | | 800 |
| - කාර්යාල උපකරණ | | 500 |
| විකුණුම් | | 12 000 |
| විකුණුම් භාණ්ඩවල පිරිවැය | 7 000 | |
| 2003.03.31 දිනට තොගය - පිරිවැයට | 300 | |
| විගණන ගාස්තු | 250 | |
| රක්ෂණ වියදම් | 330 | |

[ දෙවෙනි පිටුව බලන්න.

www.artsapi.lk www.pastpaperlk.com

| | | |
|---|---|---|
| පරිපාලන වියදම් | 800 | |
| අධ්‍යක්ෂ සංවේතන | 1 000 | |
| බෙදහැරීමේ වියදම් | 350 | |
| ප්‍රචාරණය | 150 | |
| ගෙවූ ණයකර පොලී | 100 | |
| ලද වට්ටම් | | 100 |
| ණයගැතියෝ | 850 | |
| ණයහිමියෝ | | 500 |
| 20 % ණයකර | | 1 000 |
| 2001/2002 වසර සඳහා ආදයම් බදු සඳහා වෙන්කිරීම | | 200 |
| ආදයම් බදු ගෙවීම් | | |
| - 2001/2002 වසර සඳහා | 300 | |
| - 2002/2003 වසර සඳහා | 350 | |
| කොටස් අවිනිශ්චිත ගිණුම | 150 | |
| මුදල් හා බැංකු ශේෂය | 270 | |
| | 20 000 | 20 000 |

අතිරේක තොරතුරු:

(i) 2003 මාර්තු 31 දිනට ඇති තොගයේ ශුද්ධ උපලබ්ධ්‍ය අගය රු. 260 000 ක් යැයි ඇස්තමේන්තු කර ඇත.

(ii) 2003 මාර්තු 31 දිනට උපචිත විගණන ගාස්තුව රු. 50 000 ක් වූ අතර ඉදිරියට ගෙවූ රක්ෂණ වියදම රු. 30 000 කි.

(iii) කාර්යාල උපකරණ පිරිවැය මත වර්ෂයකට 25 % ක්ෂය කළ යුතු වේ.

(iv) 2000 ඔක්තෝබර් 01 දින රු. 800 000 කට මිලදී ගෙන තිබූ බෙද හැරීමේ රථයක් 2002 ඔක්තෝබර් 01 දින රු. 600 000 කට විකුණන ලදී. විකුණුම් මුදල, මුදල් ගිණුමට හර කර බෙද හැරීමේ රථ ගිණුමට බැර කිරීම හැර මෙම විකිණීම සම්බන්ධ ව වෙනත් කිසිම සටහනක් තබා නොමැත. බෙද හැරීමේ රථ පිරිවැය මත වර්ෂයකට 20 % ක් ක්ෂය කරනු ලැබේ.

(v) 20 % ණයකර සියල්ල නිකුත් කරන ලද්දේ 2002 ජූලි 01 දින ය.

(vi) 2002/2003 වසරේ ආදයම් බද්ද රු. 500 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2001/2002 වර්ෂය සඳහා එකඟ වූ ආදයම් බද්ද මෙම වර්ෂය තුළ දී සම්පූර්ණයෙන් ම ගෙවා ඇත.

(vii) 2003 ජනවාරි මාසයේ රජයේ අනුමත වැඩිහිටි නිවාසයකට සමාගම විසින් ප්‍රථම වතාවට ඉඩම් කැබැල්ලක් පරිත්‍යාග කරන ලදී. මෙම ඉඩමේ පිරිවැය රු. 1 000 000 කි. ඒ සම්බන්ධ ව කිසිදු සටහනක් පොත්වල තබා නැත.

(viii) 2002 අප්‍රේල් 01 දින රු. 10 වූ 18 % නිදහස් කළ හැකි වරණීය කොටස් 50 000 ක් කොටසකට රු. 2 ක අධිමිලක් සමග නිදහස් කරන ලදී. මේ සඳහා රු. 10 සාමාන්‍ය කොටස් 30 000 ක් කොටසක් රු. 15 බැගින් නිකුත් කරන ලදී. මෙම සාමාන්‍ය කොටස් නිකුත් කිරීමෙන් රැස්කර ගත් මුදල් හා වරණීය කොටස් හිමියන්ට ගෙවූ මුදල්, මුදල් පොතේ හා කොටස් අවිනිශ්චිත ගිණුමේ වාර්තාගත කර ඇත. මේ හැර මෙම ගනුදෙනු සම්බන්ධයෙන් වෙනත් කිසිදු සටහනක් තබා නැත.

(ix) මෙම වර්ෂය තුළ දී කිසිදු කොටස් වර්ගයක් සඳහා ලාභාංශ ප්‍රකාශ නොකිරීමට අධ්‍යක්ෂකවරු තීරණය කර ඇත.

අවශ්‍යවන්නේ:

(1) 2003 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකෘතියට අනුව ලාභාලාභ ගිණුම හා එදිනට ශේෂ පත්‍රය.

(2) 2003 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, ලබා දී ඇති තොරතුරු ඇසුරෙන් හඳුනාගත හැකි සමාගමේ ආයෝජන ක්‍රියාකාරකම් හා මූල්‍ය ක්‍රියාකාරකම්වලට අදාළ මුදල් ප්‍රවාහ. (මෙහෙයුම් ක්‍රියාකාරකම්වලට අදාළ මුදල් ප්‍රවාහ දැක්වීම අවශ්‍ය නොවේ.)

*(ලකුණු 26 යි.)*

*(මුළු ලකුණු 36 යි.)*

[ තුන්වෙනි පිටුව බලන්න.

www.pastpaperlk.com
www.artsapi.lk

2. (අ) පහත සඳහන් ශේෂයන් සීමිත නෙලුම් සමාගමේ පොත්වලින් 2003 මාර්තු 31 දිනට උපුටා ගන්නා ලදී.

| | රු. | රු. |
|---|---|---|
| එකක් රු. 10 වූ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 2 500 000 |
| එකක් රු. 10 වූ 15 % වරණීය කොටස් ප්‍රාග්ධනය | | 1 000 000 |
| පොදු සංචිතය | | 850 000 |
| 2002.04.01 දිනට ලාභ'ලාභ ගිණුමේ (බැර) ශේෂය | | 100 000 |
| 2002/2003 වර්ෂයේ බදු ගෙවූ පසු ශුද්ධ ලාභය | | 1 300 000 |
| ගෙවූ අතුරු ලාභාංශ: | | |
| - වරණීය | 100 000 | |
| - සාමාන්‍ය | 250 000 | 350 000 |

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2003 මාර්තු 31 දින පහත සඳහන් තීරණ ගන්නා ලදී.

(i) රු. 150 000 ක් පොදු සංචිතයට මාරු කිරීමට.

(ii) සාමාන්‍ය කොටස් සඳහා 20 % ක අවසන් ලාභාංශයක් ද වරණීය කොටස් සඳහා ඉතිරි ලාභාංශ ද ප්‍රකාශ කිරීමට

(iii) පොදු සංචිතය යොදගෙන, තිබෙන සෑම සාමාන්‍ය කොටස් 5 ක් සඳහා ම එක් සාමාන්‍ය කොටස බැගින් ප්‍රසාද කොටස් නිකුත් කිරීමට. මෙම ප්‍රසාද කොටස් මෙම වර්ෂයේ දී ලාභාංශ ලැබීමට හිමිකම් නොලබයි.

අවශ්‍යවන්නේ:

(1) 2003 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ'ලාභ විසර්ජන ගිණුම (ලකුණු 02 යි.)

(2) අධ්‍යක්ෂවරුන් ගන්නා ලද තීරණ වාර්තාගත කිරීමට අදළ ජ'නල් සටහන් (ලකුණු 02 යි.)

(3) ඉහතින් සඳහන් කළ අධ්‍යක්ෂ තීරණ ක්‍රියාත්මක කිරීමෙන් පසු පහත සඳහන් ගිණුම්වල 2003.03.31 දිනට අවසන් ශේෂ

(i) සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය

(ii) පොදු සංචිතය (ලකුණු 01 යි.)

(4) අධ්‍යක්ෂ තීරණ ක්‍රියාත්මක කිරීමෙන් පසු 2003 මාර්තු 31 දිනට කොටස් හිමියන්ගේ හිමිකම (ලකුණු 01 යි.)

(ආ) සීමිත රෝස සමාගම රු. 10 සාමාන්‍ය කොටස් 500 000 ක අනුදත් ප්‍රාග්ධනයක් සහිත ව 2003 ජනවාරි 01 දින සංස්ථාපිත කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය මෙම කොටස්වලින් කොටස් 100 000 ක්, එකක් රු. 15 බැගින් නිකුත් කොට පහත දක්වෙන පරිදි මුදල් ලබා ගැනීමට තීරණය කළේ ය.

ජනවාරි 15 - අයදුම්පත් සමග රු. 4

පෙබරවාරි 15 - විභජනයේ දී රු. 6 (අධිමිල ද සහිත ව)

මාර්තු 31 - ඇරයුමේ දී රු. 5

කොටස් 150 000 සඳහා අයදුම්පත් ලැබුණි. වැඩිපුර ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරන ලද අතර ඔවුන්ගෙන් ලද අයදුම් මුදල් ආපසු ගෙවන ලදී. කොටස් 5 000 ක ඇරයුම් මුදල් හැර අනෙක් සියලු ම මුදල් නියමිත දිනයන්හි ලැබුණි.

අවශ්‍යවන්නේ,

(1) ඉහත කොටස් නිකුතුව වාර්තා කිරීමට අදළ ජ'නල් සටහන් (මුදල් ද ඇතුළු ව) (ලකුණු 06 යි.)

(2) 2003 මාර්තු 31 දිනට පහත සඳහන් ශේෂයන් (රුපියල්වලින්)

(i) අනුදත් සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය

(ii) නිකුත් කළ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය

(iii) ගෙවා නිමි සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය

(iv) හිඟ හිටි ඇරයුම් (ලකුණු 02 යි.)

(3) 2003 අප්‍රේල් 01 දින ඇරයුම් හිඟ හිටි කොටස් 5 000 අහිමි කරන ලදී. මැයි 01 දින ඉන් කොටස් 3 000 ක් රු. 8 බැගින් සම්පූර්ණයෙන් ගෙවා නිමි කොටස් ලෙස නැවත නිකුත් කර මුදල් ලබා ගන්නා ලදී. කොටස් අහිමි කිරීමේ හා නැවත නිකුත් කිරීමේ ගිණුම පිළියෙල කරන්න. (ලකුණු 02 යි.)

(මුළු ලකුණු 16 යි.)

[ හතරවෙනි පිටුව බලන්න.

3. (අ) පහත සඳහන් පද කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) විකුණුම් විස්තරය

(ii) කැපකරු කොමිස්

(ලකුණු 02 යි.)

(ආ) ගිහාන් සහෝදරයෝ තේ පෙට්ටි 100 ක් නියෝජන පදනම මත නවීන් ස්ටෝර්ස් වෙත යැවීය. මෙහි මුළු පිරිවැය රු. 300 000 ක් වූ අතර තොගය යැවීමේ ප්‍රවාහන වියදම වූ රු. 10 000 ගිහාන් සහෝදරයෝ දැරිය. බාල වර්ගයේ තේ අඩංගු ව තිබූ නිසා ඉන් තේ පෙට්ටි 10 ක් නවීන් ස්ටෝර්ස් විසින් රු. 2 000 ක වියදමක් දරා ආපසු එවා ඇත. මාසයක් ගත වූ පසු නවීන් ස්ටෝර්ස් තේ පෙට්ටි 70 ක් රු. 350 000 ක මුදලකට විකුණූ බවත්, ගබඩා වියදම් ලෙස රු. 18 000 ක් ද විකුණුම් වියදම් ලෙස රු. 21 000 ක් ද දැරූ බවත් දන්වා සිටියහ. දළ විකුණුම්වලින් 10 % ක් වූ කොමිස් මුදල හා දැරූ වියදම් අඩු කර ගෙන ඉතිරි මුදල ඉදිරියේ දී ගෙවන බවට ඔවුහු දන්වා සිටියහ.

අවශ්‍යවන්නේ:

(1) නියෝජන ගිණුම

(2) නවීන් ස්ටෝර්ස් ගිණුම

(ලකුණු 05 යි.)

(ඇ) පරිසර හිතකාමී ක්‍රියාකාරකම්හි නිරතවීමේ අරමුණින් 'තුරුලිය සමිතිය' නමින් සමාජ සංවිධානයක් 2003 ජනවාරි 01 දින ගමක තරුණ කොටස් එකතු වී පිහිටුවා ගන්නා ලදී. 2003 මාර්තු 31 දිනෙන් අවසන් වූ මාස 03 තුළ දී සිදුවූ ක්‍රියාකාරකම්හි සාරාංශය මෙසේ ය.

(i) තුරුලිය සමිතියට බැඳීමේ දී ඇතුළත්වීමේ ගාස්තු ලෙස එක් අයකුගෙන් රු. 50 ක් අය කරන අතර, ඊට අමතර ව කාර්තුවකට ගෙවිය යුතු සාමාජික මුදල රු. 20 කි. මාර්තු 31 දින වන විට බැඳී තිබූ සාමාජික සංඛ්‍යාව 100 කි.

(ii) ජනවාරි මාසයේ දී සමිතිය විසින් පැළ සිටුවීමේ ව්‍යාපාරයක් සිදු කරන ලදී. පැළ රැස්කර ගැනීමේ වියදම රු. 500 ක් විය. එදින සාමාජිකයින්ගේ තේ සහ ආහාර වෙනුවෙන් රු. 1 000 ක් වැය විය.

(iii) පෙබරවාරි මාසයේ දී රු. 2 000 ක වියදමක් දරා ප්‍රදේශයේ වැවක් පිරිසිදු කළ අතර ඒ වෙනුවෙන් පළාත් පාලන ආයතනයෙන් රු. 5 000 ක මුදලක් ලැබිණි.

(iv) ඉදිරි මාසවල දී ගමේ නිවෙස් අතර නොමිලේ පැළ බෙද හැරීම සඳහා මාර්තු මාසයේ පැළ තවාන් ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මෙහි මූලික වියදම ලෙස රු. 1 000 ක් වැය වූ අතර බීජ ඇට ලබා ගැනීම වෙනුවෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ගෙවීමට ඇති මුදල රු. 1 200 කි. මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රදේශයේ වාණිජ බැංකුවක් විසින් රු. 5 000 ක පරිත්‍යාගයක් කර ඇත.

(v) පරසරය පුරැකීම පිළිබඳ ව ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් ස්ථාන කිහිපයක දැන්වීම් පුවරු සවිකරන ලදී. මේ සඳහා ව්‍යාපාරිකයකු විසින් රු. 3 000 ක් වටිනා තීන්ත පරිත්‍යාග කරන ලදී. ඒ සම්බන්ධ ව අනෙකුත් ද්‍රව්‍ය වෙනුවෙන් සමිතිය විසින් රු. 2 000 ක වියදමක් දරන ලදී. දැන්වීම් පුවරු සවිකිරීම සාමාජිකයින් විසින් ස්වේච්ඡාවෙන් සිදු කරන ලද අතර දැන්වීම් පුවරු ප්‍රවාහනය කළ වියදම රු. 500 කි. මෙම වියදම තවම ගෙවා නැත.

අවශ්‍යවන්නේ:

ඇතුළත්වීමේ ගාස්තුවලින් 25 % ක් පමණක් පළමු කාර්තුවේ ආදායම ලෙස සලකන්නේ යැයි උපකල්පනය කොට 2003 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ආදායම් හා වියදම් ගිණුම.

(ලකුණු 06 යි.)

(ඉ) පහත සඳහන් පද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව නිර්වචනය කරන්න.

(i) මෙහෙයුම් ක්‍රියාකාරකම්

(ii) අති විශේෂ අයිතම

(iii) ශේෂ පත්‍ර දිනට පසු ඇති වූ සිද්ධීන්

(ලකුණු 03 යි.)

(මුළු ලකුණු 16 යි.)

[ පස්වෙනි පිටුව බලන්න.

www.pastpaperlk.com www.artsapi.lk

4. (අ) සුහාසිරි සමාගම ඇඳුම් නිෂ්පාදනය කර අලෙවි කරයි. මෙම සමාගමේ පිරිවැය අයිතම කිහිපයක් පහත :
පිරිවැය අයිතම:

(i) ඇඳුම් සඳහා භාවිත වන ආනයනය කරන ලද ලේස් පටි.
(ii) නිෂ්පාදිත ඒකක මත ගෙවිය යුතු ස්වාධිකාරය
(iii) මහන මැෂින් සඳහා ලිහිසි තෙල්
(iv) මැහුම් අංශයේ යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ වේතන
(v) රූපවාහිනී ප්‍රචාරණ වියදම්
(vi) අමුද්‍රව්‍ය ගබඩාවේ ගබඩාකරුවන්ගේ වේතන
(vii) බෙදාහැරීමේ වාහන සඳහා රක්ෂණ වාරික
(viii) කර්මාන්තශාලාවේ ආරක්ෂක නිලධාරීන්ගේ වේතන

අවශ්‍යවන්නේ:

ඉහත එක් එක් පිරිවැය අයිතමය සෘජු ද්‍රව්‍ය ද, සෘජු ශ්‍රම ද, වෙනත් සෘජු වියදමක් ද, නිෂ්ප: පොදුකාර්ය ද, නිෂ්පාදන නොවන පොදුකාර්ය ද යන්න සඳහන් කරන්න. (පිළිතුරු ලිවීමේ දී පිරිවැය අයිතම අංකය පැහැදිලි ව ලියා ඒ ඉදිරියෙන් පිරිවැය වර්ගය සඳහන් කිරීම ප්‍රමාණවත් ය.)

(ලකුණු 04

(ආ) සෝලෝ සමාගම තුමන් නිකුත් කරන ද්‍රව්‍ය මිල කිරීම සඳහා පෙර ඇතුළු පෙර පිට (FIFO) ක්‍රමය යොදා Z නමැති ද්‍රව්‍යයට අදාළ ව පහත දැක්වෙන ගනුදෙනු සිදු විය.

ජනවාරි 30 - ගැනුම් ඒකක 100, ඒකකයක් රු. 10 බැගින්
පෙබරවාරි 12 - ගැනුම් ඒකක 50, ඒකකයක් රු. 12 බැගින්
පෙබරවාරි 18 - නිකුත් කිරීම් ඒකක 110
මාර්තු 6 - ගැනුම් ඒකක 50, ඒකකයක් රු. 13 බැගින්
මාර්තු 20 - නිකුත් කිරීම් ඒකක 80

අවශ්‍යවන්නේ:

(1) තොග ලෙජරය පිළියෙල කර මාර්තු 31 දිනට ඉතිරි තොගයේ අගය පැහැදිලි ව දක්වන්න.
(2) පෙර ඇතුළු පෙර පිට (FIFO) ක්‍රමයේ වාසියක් සහ අවාසියක් දක්වන්න.

(ලකුණු 04 යි

(ඇ) උදගිර සමාගම සඳහා වාර්ෂික ව විශේෂිත වර්ගයක ඇසුරුම් ද්‍රව්‍ය ඒකක 4 500 ක් අවශ්‍ය වේ. එවා ඒකා රු. 1 000 බැගින් මිලයට ගත හැකි ය. ඇණවුම් කිරීමේ පිරිවැය ඇණවුමකට රු. 2 000 කි. වාර්ෂික තොග තබා ගැනීමේ පිරිවැය, ඒකකයට ගැනුම් මිලෙන් 20 % කි.

අවශ්‍යවන්නේ:

(1) ආර්ථික ඇණවුම් ප්‍රමාණය
(2) වර්ෂයක් තුළ සිදු කළ යුතු ඇණවුම් ගණන

(ලකුණු 02 යි.

(ඉ) සීමිත සුපර්ටයිල් සමාගම විශේෂිත උළුකැට වර්ගයක් නිෂ්පාදනය කරයි. නිෂ්පාදන ක්‍රියාවලියේ දී භාවිතවන යන්ත්‍රයක් සම්බන්ධ පිරිවැය තොරතුරු පහත දැක්වේ.

- යන්ත්‍ර පිරිවැය රු. 1 400 000
- යන්ත්‍රයේ ඵලදායී ජීවකාලය වසර 4 කි. එහි සුන්බුන් අගය රු. 400 000 කි.
- යන්ත්‍රය වසරකට දෙවරක් නඩත්තු කළ යුතු ය. එක් නඩත්තු වාරයක් සඳහා වියදම රු. 12 000 කි.
- සෑම උළුකැට 1 000 ක් නිෂ්පාදනයෙන් පසුව යන්ත්‍රයේ ප්‍රතිසම්පාදනය කළ යුතු අමතර කොටසේ පිරිවැය රු. 2 000 කි.
- උළුකැට 10 ක් නිෂ්පාදනය කිරීම සඳහා යන්ත්‍රයට ඉන්ධන ලීටර 1 ක් අවශ්‍ය වේ. ඉන්ධන ලීටරයක මිල රු. 50 කි.
- මෙම යන්ත්‍රයෙන් වාර්ෂික ව නිෂ්පාදනය කළ හැකි උපරිම උළුකැට ප්‍රමාණය 20 000 කි.

අවශ්‍යවන්නේ:

(1) යන්ත්‍රය උපරිම ධාරිතාවෙන් ක්‍රියාත්මක වේ නම් යන්ත්‍රයට අදාළ මුළු පොදුකාර්ය පිරිවැය හා උළුකැටයකට අන්තර්ග්‍රහණය කළ යුතු පොදුකාර්ය පිරිවැය
(2) සමාගම වසරකට උළුකැට 10 000 ක් පමණක් නිපදවයි නම් මුළු පොදුකාර්ය පිරිවැය හා උළුකැටයකට අන්තර්ග්‍රහණය කළ යුතු පොදුකාර්ය පිරිවැය.

(ලකුණු 06 යි.)

(මුළු ලකුණු 16 යි.)



www.pastpaperlk.com www.artsapi.lk

(අ) බැසිල් සමාගම ගණුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවයනට අනුව ... බහු නිෂ්පාදනය කරන ආයතනයකි. මෙම ආයතනය නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකකින් හා සේවා දෙපාර්තමේන්තුවකින් සමන්විත ය. ඉදිරි කාල පරිච්ඡේදයක් සඳහා පිරිවැය ඇස්තමේන්තු පහත දක්වේ.

| පොදුකාර්ය පිරිවැය | නිෂ්පාදන දෙපාර්තමේන්තු | | සේවා දෙපාර්තමේන්තුව |
|---|---|---|---|
| | A | B | S |
| | රු. '000 | රු. '000 | රු. '000 |
| වක්‍ර ද්‍රව්‍ය | 240 | 90 | 15 |
| වක්‍ර වේතන | 180 | 60 | 10 |
| වක්‍ර වියදම් | 15 | 10 | 5 |

| අනෙකුත් පොදුකාර්ය පිරිවැය | රු. '000 |
|---|---|
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ක්ෂය කිරීම් | 200 |
| කුලී, වරිපනම් හා විදුලිය | 150 |
| සේවක සුභසාධන වියදම් | 100 |

වෙනත් අදාළ තොරතුරු

| | දෙපාර්තමේන්තු | | |
|---|---|---|---|
| | A | B | S |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ගැනුම් මිල රු. '000 | 1 250 | 700 | 50 |
| බිම් ප්‍රමාණය (වර්ග මීටර) | 30 000 | 15 000 | 5 000 |
| සේවක සංඛ්‍යාව | 30 | 15 | 5 |
| සෘජු ශ්‍රමය (පැය) | 37 000 | 33 500 | - |

සේවා දෙපාර්තමේන්තුව, නිෂ්පාදන දෙපාර්තමේන්තුවලට සමාන ව සේවා සපයයි.

අවශ්‍යවන්නේ:

(1) අනෙකුත් පොදුකාර්ය පිරිවැය දෙපාර්තමේන්තු අතර විභජනය කරන්න.

(2) සේවා දෙපාර්තමේන්තුවේ පොදුකාර්ය පිරිවැය A හා B දෙපාර්තමේන්තු අතර යළි විභජනය කරන්න.

(3) සෘජු ශ්‍රම පැය පදනම මත දෙපාර්තමේන්තුව A සහ දෙපාර්තමේන්තුව B සඳහා පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත ගණනය කරන්න.

(ලකුණු 07 යි.)

(ආ) ඉහත (අ) හි සඳහන් කළ බැසිල් සමාගමට ඇණවුමක් ලැබුණු අතර ඊට අදළ පිරිවැය ඇස්තමේන්තු සහ අනෙකුත් විස්තර පහත පරිදි වේ.

සෘජු ද්‍රව්‍ය: M1 රු. 400
M2 රු. 250

සෘජු ශ්‍රමය: දෙපාර්තමේන්තුව A : පැය 8 ක්, පැයකට රු. 80 බැගින්

සෘජු ශ්‍රමය: දෙපාර්තමේන්තුව B : පැය 6 ක්, පැයකට රු. 60 බැගින්

සෘජු වියදම්: රු. 30

නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය, සෘජු ශ්‍රම පැය පදනම මත අන්තර්ග්‍රහණය කෙරේ. නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය ආවරණය කර ගැනීමට සහ ලාභ කොටස වශයෙන්, නිෂ්පාදන පිරිවැයට 10% ක ආන්තිකයක් එකතු කරනු ලැබේ.

අවශ්‍යවන්නේ:

පහත දක්වෙන අයිතමයන්හි අගයන් දක්වමින් මෙම ඇණවුම සඳහා පිරිවැය පත්‍රයක් පිළියෙල කරන්න.

(i) ප්‍රාථමික පිරිවැය

(ii) අන්තර්ග්‍රහණය කළ පොදුකාර්ය පිරිවැය (ලකුණු 03 යි.)

(iii) අපේක්ෂිත විකුණුම් මිල

[ හත්වෙනි පිටුව බලන්න.

www.pastpaperlk.com www.artsapi.lk

) සුහද සමාගමේ 2003 මාර්තු 31 දිනෙන් අවසන් වන මාසයට අදාළ සේවක වේතන පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවකයාගේ නම | පැය 8 බැගින් වැඩ කළ දින ගණන | මාසයේ වැඩ කළ අතිකාල පැය |
|---|---|---|
| නීතා | 25 | 12 |
| ගීතා | 22 | 6 |
| සීතා | 20 | - |

වේතනවලට අදාළ අනෙකුත් විස්තර පහත දැක්වේ.

(i) ගෙවීම් අනුපාත:
- පැය 8 ක වැඩ දිනයක් සඳහා සාමාන්‍ය වේතනය (අතිකාල දීමනා හැර) රු. 400 යි.
- අතිකාල ගෙවීම සාමාන්‍ය පැයක වේතනය මෙන් දෙගුණයකි.

(ii) සේවක අර්ථ සාධක අරමුදලට දායකය සේවා යෝජකයාගෙන් 15 % ක් ද, සේවකයාගෙන් 10% ක් ද වේ. (අතිකාල ගෙවීම අර්ථ සාධක අරමුදල් ගණනය කිරීම සඳහා සැලකිල්ලට නොගැනේ.)

(iii) රු. 1 200 ක උත්සව අත්තිකාරමක් 2002 දෙසැම්බර් මාසයේ දී සීතාට ගෙවා තිබුණි. මෙය ආපසු අයකර ගැනීමේ මාසික වාරිකය වන රු. 100 ඇයගේ මාර්තු මස වේතනයෙන් අඩු කරගෙන ඇත.

(iv) නීතාගේ ඉල්ලීම පරිදි ඇගේ බැංකු ණය මුදලේ මාසික වාරිකය වන රු. 1 500 ක් ඇගේ මාර්තු වැටුපෙන් අඩු කර ගෙන සෘජුව ම ඇගේ බැංකුව වෙත ප්‍රේෂණය කර ඇත.

(v) සෑම මාසයක ම වේතනය ඊට පසු මාසයේ පළමු සතිය තුළ ගෙවීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

අවශ්‍යවන්නේ:

(1) 2003 මාර්තු මාසය සඳහා සමාගමේ වැටුප් ලේඛනය පිළියෙල කරන්න.

(2) වැටුප් ලේඛනයේ තොරතුරු, වේතන පාලන ගිණුම මගින් පොදු ලෙජරයේ අදාළ ගිණුම්වලට පිටපත් කරන්න. (ලකුණු 06 යි.)

(මුළු ලකුණු 16 යි.)

(අ) "මූල්‍ය ගිණුම්කරණය" හා "කළමනාකරණ ගිණුම්කරණය" අතර වෙනස්කම් දෙකක් දක්වන්න. (ලකුණු 01 යි.)

(ආ) ජය ඉසුරු සමාගමේ, 2003 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ සංක්ෂිප්ත ප්‍රතිඵල පහත දැක්වේ.

**2003 මාර්තු 31 දිනට ශේෂ පත්‍රය**

| | රු. '000 | | | රු. '000 | |
|---|---|---|---|---|---|
| හිමිකම් | | | ස්ථාවර වත්කම් | | |
| රු. 10 සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 300 | | යන්ත්‍ර සූත්‍ර | 250 | |
| රඳවාගත් ඉපැයුම් | 200 | 500 | උපකරණ | 150 | 400 |
| ජංගම වගකීම් | | | ජංගම වත්කම් | | |
| වෙළෙඳ ණය හිමියෝ | 40 | | තොගය | 50 | |
| ගෙවිය යුතු බිල් | 60 | 100 | වෙළෙඳ ණයගැතියෝ | 95 | |
| | | | මුදල් | 55 | 200 |
| | | 600 | | | 600 |

**2003 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ ගිණුම**

| | රු. '000 |
|---|---|
| විකුණුම් | 400 |
| විකුණුම් පිරිවැය | (300) |
| දළ ලාභය | 100 |
| මෙහෙයුම් වියදම් | (40) |
| ශුද්ධ ලාභය | 60 |

[ අටවෙනි පිටුව බලන්න.

www.pastpaperlk.com www.artsapi.lk

අවශ්‍යවන්නේ:

පහත දී ඇති ආකෘතියේ සඳහන් එක් එක් අනුපාතයට අදාළ,

(1) ගණනය කිරීමේ සූත්‍රය
(2) ජය ඉසුරු සමාගම සඳහා අනුපාතවල අගය
(3) එක් එක් අනුපාතයේ පරමාර්ථය

| අනුපාතය | සූත්‍රය | ගණනය කිරීම | පරමාර්ථය |
|---|---|---|---|
| (i) ජංගම අනුපාතය | | | |
| (ii) තොග පිරිවැටුම | | | |
| (iii) දළ ලාභ අනුපාතය | | | |
| (iv) යෙදවූ ප්‍රාග්ධනය මත ඉපැයීම | | | |

(ලකුණු 05 යි.

(ඇ) පහත දක්වෙන එක් එක් ගනුදෙනුව වෙන් වෙන් ව සලකා, එය 2003 මාර්තු 31 වන දිනට ජය ඉසුරු සමාගමේ ජංගම අනුපාතය වර්ධනය කරයි ද, දුර්වල කරයි ද, බලපෑමකින් තොරවේ ද යන්න සඳහන් කරන්න. (ගණනය කිරීම් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

(i) වෙළෙඳ ණයගැතියෙකුගෙන් ලැබිය යුතු රු. 2 000 ක මුදල බොල් ණය ලෙස කපා හැරීම.

(ii) රු. 40 000 ක් වටිනා උපකරණ මාස තුනක ණය පහසුකමක් යටතේ ලබා ගැනීම.

(iii) වෙළෙඳ ණයගැතියෙකුගෙන් රු. 5 000 ක මුදලක් එකතුකර ගැනීම.

(iv) දිගුකාලීන ණය පහසුකම් යටතේ රු. 10 000 ක් වටිනා වෙළෙඳ තොග මිලට ගැනීම. (ලකුණු 02 යි.

(ඉ) සීමිත කැළුම් සමාගම 2003 මැයි මස 01 දින ව්‍යාපාරික කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. 2003 ජුලි මස 31 දක්වා වන මාස තුනක කාලය සඳහා අපේක්ෂිත ගනුදෙනු පහත දක්වා ඇත.

(i) මැයි 01 දින රු. 10 සාමාන්‍ය කොටස් 100 000 ක් සමමිලට නිකුත් කර අයදුම සමග සම්පූර්ණ මුද එකතු කර ගනු ඇත.

(ii) මැයි 10 දින රු. 300 000 ක් වටිනා උපකරණ හා ලීබඩු අත්පිට මුදලට ගනු ඇත.

(iii) මැයි 01 දින එකක් රු. 500 000 ක් බැගින්, බෙදා හැරීම සඳහා යොදා ගන්නා වෑන් රථ දෙකක් අත්ප කරගනී. එක් වාහනයක් සඳහා රු. 50 000 ක අත්තිකාරම් මුදලක් ගෙවිය යුතු වේ. ඉතිරිය මැයි 31 දිනෙ ඇරඹෙන මාසික වාරික 10 කින් ගෙවනු ඇත. පොලී ගෙවීම් නොසලකා හරින්න.

(iv) ව්‍යාපාරයේ ආරම්භක භාණ්ඩ තොගය රු. 300 000 (ඒකකයක් රු. 30 බැගින්) මැයි මාසය ආරම්භයේ දී ම මිලට ගනු ඇත. ඊට පසු ද ඒකකයක් රු. 30 බැගින් භාණ්ඩ මිලයට ගනු ලබන අතර මෙ ආරම්භක තොග මට්ටම සෑම මාසයක් අවසානයේ ම පවත්වා ගත යුතු ය. මේ සෑම ගැනුමක් ම ණය ගැනුම් වන අතර භාණ්ඩ ගත් මාසයට පසු මාසයේ සැපයුම්කරුවනට මුදල් ගෙවා නිම කරනු ඇත.

(v) සියලු විකුණුම්, ණය විකුණුම් වන අතර ඒකකයක විකුණුම් මිල රු. 50 කි.

පුරෝකථනය කළ විකුණුම්:

මැයි : ඒකක 60 000

ජූනි : ඒකක 70 000

ජූලි : ඒකක 80 000

විකුණුම් සඳහා ණයගැතියන් මුදල් ගෙවනු ලබන්නේ විකුණුම් සිදු වූ මාසයට පසුව එළඹෙන දෙවැ මාසයේ දී ය.

(vi) පරිපාලන වියදම්, විකුණුම්වලින් 5 % ක් වෙතැයි අපේක්ෂා කරන අතර ඒවා දරන මාසයේ ම ගෙවනු ඇ

අවශ්‍යවන්නේ:

2003 මැයි, ජූනි සහ ජූලි මාස සඳහා වූ මුදල් අයවැය ලේඛනය මාසික තීරු ක්‍රමයට පිළියෙල කරන්න.

(ලකුණු 08 ය

(මුළු ලකුණු 16 ය

* * *

www.pastpaperlk.com
www.artsapi.lk